# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2475/28 - 2026 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා - 2026.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021(IV)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වන වගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 71 වන වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 13 වන දින,
කොළඹ දී ය.

නියෝග

2024 අප්‍රේල් මස 22 වන දින අංක 2381/24 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2024 අංක I දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ-තීරුබදු රහිත මෙහෙයුම්) නියෝගවල II වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපලේඛනයේ II වන තීරයේ -

(අ) අවසරලත් භාණ්ඩවල අවසරලත් ප්‍රමාණ (I වන උපලේඛනය බලන්න) නිරූපණය කරන අංක 2 දරන පේළියේ, “I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි” යන වචන සහ ඉලක්කම වෙනුවට “විදේශ සංචාරයකින් පසුව ශ්‍රී ලංකාවට පැමිණීමේ එක් එක් අවස්ථාව සම්බන්ධයෙන්, I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි” යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

1A - PG 7525 — 378 (2026/02)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) දීමනාවන් ආරම්භ වීම නිරූපණය කරන අංක 3 දරන පේළියේ "ශ්‍රී ලංකාවට පැමිණි පළමුවන දිනයේ (FDOA)සිට දින 4ක් ඇතුළත." යන වචන සහ ඉලක්කම වෙනුවට, "පිවිසුම් ලියාපදිංචි කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවට පැමිණි දිනයේ සිට දින 4ක් ඇතුළත" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(ඇ) දීමනාවේ වලංගු කාලසීමාව නිරූපණය කරන අංක 4 දරන පේළියේ, "ශ්‍රී ලංකාවට පැමිණි පළමුවන දිනයේ (FDOA) සිට වාර්ෂික දීමනාව" යන වචන වෙනුවට, "දීමනාවන් ආරම්භ වීමේ දිනයේ සිට අවුරුදු එකක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) මිල දී ගැනීමේ කාලසීමාව නිරූපණය කරන අංක 5 දරන පේළියේ, "ශ්‍රී ලංකාවට පැමිණි පළමුවන දිනයේ (FDOA) සිට දින 4ක් ඇතුළත එක් වාරයක්" යන වචන සහ ඉලක්කම වෙනුවට, "එක් එක් විදේශ සංචාරය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවට පැමිණි දිනයේ සිට දින 4ක් ඇතුළත" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(ඉ) පැමිණිය හැකි වාර ගණන (මිල දී ගැනීමේ කාලසීමාව තුළ) නිරූපණය කරන අංක 6 දරන පේළියේ, "ශ්‍රී ලංකාවට පැමිණි පළමු වන දිනයේ (FDOA) සිට දින 4ක් ඇතුළත වාර්ෂිකව එක් වාරයක්" යන වචන සහ ඉලක්කම වෙනුවට, "විදේශ සංචාරයකින් පසුව ශ්‍රී ලංකාවට පැමිණීමේ එක් එක් අවස්ථාව සම්බන්ධයෙන්, දින 4ක් වන මිල දී ගැනීමේ කාලසීමාව ඇතුළත පැමිණීමේ වාර දෙකක්" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්; සහ

(2) "II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවසරලත් දීමනාවලට අදාළ විකිණීමේ කොන්දේසි" හි අයිතම අංක 2 ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

| | |
|---|---|
| "2. | II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඇමෙරිකානු ඩොලර් 2,000ක වාර්ෂික තීරුබදු රහිත දීමනාව, දීමනාවන් ආරම්භ වීමේ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් සඳහා වලංගුව පැවතිය යුතු අතර, තීරුබදු රහිත දීමනාවෙන් ඉතිරිව පවතින යම් මුදල් ප්‍රමාණයක් ඒ කාලසීමාව අවසානයේ දී කල් ඉකුත් විය යුතු ය." |

EOG 02 - 0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.